සියලු ම හිමිකම් ඇවිරිණි / *All Rights Reserved*

# Royal College - Colombo 07
## රාජකීය විද්‍යාලය - කොළඹ 07

**Grade 11 – Third Term Evaluation – October 2020**

**තෙවන වාර පරීක්ෂණය – 2020 –11 ශ්‍රේණිය**

කාලය : පැය 2
**Time: 2 hours**

නර්තනය **– II**
**Dancing – II**

| | | |
|---|---|---|
| **44** | **S** | **II** |

**පළමු කොටස ඇතුළුව ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න**

01. සුදුසු වචන යොදා හිස්තැන් සම්පූර්ණ කරන්න.

( i ) ගද්‍ය සහ පද්‍ය කොටස් දෙකකින් සමන්විත .......................... සී පද ජන ගායනා විශේෂයකි.

( ii ) බෞද්ධාගමික සිද්ධස්ථානවල සිදු කෙරෙන දවුල්, තම්මැට්ටම්, හොරණෑ වාදනය ..................................... නමින් හැඳින්වේ.

( iii ) "මහනුවර පෙරහැරේ රූමත් තරුණියේ ලස්සනට නටත්, ඔවුන්ගේ උඩුකය නග්න වූ අතර යටිකයේ වැඩ දැමූ වස්ත්‍ර ඇත්තේ ය" යනුවෙන් සටහන් කර ඇත්තේ මහනුවර යුගයේ ලංකාවට පැමිණි .................................................... නැමති ලන්දේසි ජාතිකයා විසිනි.

( iv ) ස්වභාව සෞන්දර්ය වර්ණනා, දෙවියන්, විවිධ වස්තූන්, සතුන් ආදී වර්ණනා ......................... ගායනවලට ඇතුළත් වී ඇත.

( v ) බෞද්ධාගමික උත්සව අවස්ථාවන්හි සූවිසි විවරණ, සත්සති ආදි බුදුගුණ ගායනා කෙරෙන ........................................ නර්තනය පත්තිනි දෙවියන් හා බැඳෙන්නකි.

( vi ) උඩරට නර්තන සම්ප්‍රදායේ **අස්නේ** නර්තනය ගායනය ..................................... නර්තනයකි.

( vii ) නර්තන සම්ප්‍රදායන් තුනටම පොදු වූ ........................................... ශාන්තිකර්මය නවග්‍රහයින් උදෙසා කරනු ලබයි.

( viii ) සිංහල ජන නැටුමේ එන ලී මල්ලිය, දෙමළ ජන නැටුමේ දී .................................... ලෙස හඳුන්වයි.

( ix ) පහත සඳහන් වාද්‍ය භාණ්ඩ දෙක වාදනය කරනු ලබන නර්තන සම්ප්‍රදායන් දෙක නම් කරන්න.

(අ) පුං - .........................................................................

(ආ) එඩැක්ක - ..................................................................

( x ) පහත දැක්වෙන නාට්‍යමය අවස්ථා ඇතුළත් ශාන්තිකර්ම දෙක නම් කරන්න.

(අ) යක්කම් පහ - ...........................................................................

(ආ) පොත්කඩේ පාළිය - ..................................................................

සියලු ම හිමිකම් ඇවිරිණි / *All Rights Reserved*

02. (i) මාත්‍රා 3 + 4 තිතට අයත් බෙර පදයක් ප්‍රස්තාර කරන්න.

(ii) මාත්‍රා 2 + 3 තිතට අයත් වන්නමක පදයක් ප්‍රස්තාරගත කරන්න.

(iii) මාත්‍රා 4 + 4 තිතට අයත් වන්නමක අඩව්වක් ප්‍රස්තාරගත කරන්න.

03. කොහොඹා කංකාරිය, දෙවොල් මඩුව සහ පහන් මඩුව ප්‍රධාන දේශීය ශාන්තිකර්ම ලෙස හැඳින්වේ.

(i) කොහොඹා කංකාරිය ශාන්තිකර්මය පැවැත්වීමෙ අරමුණු දෙකක් ලිය දක්වන්න.

(ii) ඉහත ශාන්තිකර්ම අතුරෙන් එකක, පූර්ව චාරිත්‍ර පිළිබඳ ව හැඳින්වීමක් කරන්න.

(iii) අස්නේ, තෙල්මේ සහ මල්පද යන නර්තන අංග අතුරෙන් එකක් පිළිබඳ ව විග්‍රහයක් කරන්න.

04. පහත සඳහන් මාතෘකා අතුරෙන් තුනක් කෙටියෙන් විස්තර කරන්න

| | | | |
|---|---|---|---|
| (i) බුමමැඩිය | (ii) කාලානුකූල චලනය | (iii) ප්‍රශස්ති | (iv) යක්කම |
| (v) සමග්‍රහ | (vi) නව නළු රස | (vii) අංග රචනය | |

05. (i) අනුරාධපුර යුගයේ නර්තන කලාව පිළිබඳ දැක්වෙන ලිඛිත මූලාශ්‍ර දෙකක් නම් කරන්න.

(ii) නර්තන කලාව සඳහා රාජ්‍ය අනුග්‍රහය ලැබුණු බවට, දඹදෙණි යුගය ඇසුරෙන් සාධකයක් ඉදිරිපත් කරන්න.

(iii) ගම්පොළ යුගයේ නර්තන කලාව පිළිබඳ ව ඓතිහාසික සාධක දෙකක් විග්‍රහ කරන්න.

06. පහත රූපරාමු ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



A B C D E

(i) A හෝ B හෝ රූපයේ දැක්වෙන නර්තන සම්ප්‍රදාය පිළිබඳ හඳින්වීමක් කරන්න.

(ii) D හෝ E හෝ රූපයේ දැක්වෙන නර්තන සම්ප්‍රදායේ අංග රචනය හා වස්ත්‍රාභරණ පිළිබඳ විග්‍රහ කරන්න.

(iii) C රූපයෙන් දැක්වෙන රංග කලාවේ ආරම්භය හා විකාශනය පිළිබඳ විමසීමක් කරන්න

07. (i) සොකරි හා කෝලම නාටකවල එන චරිත දෙක බැගින් නම් කරන්න

(ii) කෝලම් නාටකය පැවැත්වීමෙ අතීත හා වර්තමාන අරමුණු සැකෙවින් විස්තර කරන්න.

(iii) සොකරි නාටකයේ රංග භාණ්ඩ හා වස්ත්‍රාභරණ පිළිබඳ විග්‍රහ කරන්න.